බාලවයස්කාර ලිංගික අපයෝජනයන් සැහැල්ලු කොට දක්වන, එසේම එවන් අවස්ථාවන්හිදී වින්දිතයන් හට වරද පටවන ආකාරයේ පුවත් වාර්තාවන් පසුගිය දිනවල බහුලව දක්නට ලැබිණි. බාල වයස්කරුවෙකුගේ කැමැත්තෙන් වුවත් ලිංගික ඇසුරක් පැවැත්වීම නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදක්, ලිංගික අපයෝජනයක් ලෙසින් දැක්වේ.
එවැනි පසුබිමකදී "ඔන්ලයින් පාඩම් මැද සිසුවිය පෙම් ලයින් එකක, ගෙදරින් පැන ගිහින් පෙම්වතාගේ ගෙදර දින 7ක් කම්සැප විඳලා" වැනි සිරස්තල සමගින් බාලවයස්කාර ලිංගික අපයෝජන සැහැල්ලු කොට සිදුවීමක් ඉදිරිපත් කිරීම පාඨක අප විසින් වටහා ගත යුත්තේ කුමන ආකාරයකටද? මෙය මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවන මාධ්‍ය හැසිරීමක් නොවන්නේද? එසේම මෙම සිරස්තලය මගින් වින්දිතයා හට වරද පැටවීමක් ද සිදු වී තිබේ.
වර්තමාන කොවිඩ්-19 වසංගත තත්වය නිසා ශිෂ්‍ය පරපුර ඔන්ලයින් අධ්‍යාපනයට වඩාත් යොමුවීම සමගින් කිසියම් සමාජ ගැටලුවක් පැන නැගී ඇත්නම්, එය වාර්තා කළ යුත්තේ මේ අයුරින් නොවන බවද, මාධ්‍ය මීට වඩා වගකීම් සහගත විය යුතු බව ද මෙසේ ම සඳහන් කරමු.
#MediaEthicsSL #lka #sinhalanews #Divaina